**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - 2020**

**----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 40A සහ 40B ඡේදවලට අනුව මූල්‍ය ප්‍රකාශන අතීතානුයෝගීව නැවත ප්‍රකාශ කළවිට (Retrospective Restatement) ප්‍රවර්තන කාලච්ඡේදය සහ ප්‍රවර්තන කාලච්ඡේදයට පෙර කාලච්ඡේද දෙකක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශ තුනක් ඉදිරිපත් කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 අවසන් වර්ෂයට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි විලම්භිත බදු සම්බන්ධව පූර්ව කාල පරිච්ඡේදයට අදාළ ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් මත විලම්භිත බදු සම්බන්ධ ශේෂයන් 2020 ආරම්භක ශේෂය 2019 ආරම්භක ශේෂය හා 2018 ආරම්භක ශේෂයට කොපමණ බලපෑමක් සිදු කළේද යන්න සටහන් අංක 8.1 යටතේ දක්වා ඇත. එමෙන්ම ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශයද 2019 හා 2018 | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ආරම්භක ශේෂයේ සිට දක්වා ඇත. ශේෂ පත්‍රයද 2018 අවසන් ශේෂයේ සිට දක්වා ඇත. ඒ අනුව ප්‍රමිත අංක 1,40එ සහ 40බී ඡේදවලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් හෙළිදරව් කර ඇත. | |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 81 A ඡේදයට අනුව වර්ෂයේ බදු පසු ලාභය හෝ අලාභය වෙන්ව දැක්වෙන පරිදි විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සකස්කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල වෙනත් විස්තීරණ ආදායම් යන්න වෙනමම දක්වා නොමැත. මෙය ඉදිරි ගිණුම් වලදී දැක්වීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 26 (a) ඡේදය අනුව විශ්‍රාමික ප්‍රතිලාභ වගකීමෙහි (Retirement Benefit Obligation) ධාරණ අගය සහ එහි බදු පදනම අතර ඇතිවන තාවකාලික වෙනස්වීමෙහි (Temporary Difference) ප්‍රතිඵලය විලම්භිත බදු වත්කමක් වුවද, විගණනයට ලබා දුන් විලම්භිත බදු උපලේඛන අනුව 2019 හා 2020 වර්ෂවල අවසන් පාරිතෝශික වගකීම මත පිළිවෙලින් රු. 65,079,965 ක් හා රු. 79,018,332 ක් ලෙස විලම්භිත බදු වගකීමක් හඳුනාගෙන තිබූ අතර මේ හේතුවෙන් අවසන් ශුද්ධ බදු වගකීම 2019 වර්ෂයේදී රු. 130,159,930 කින් හා 2020 දී රු. 158,036,664 කින් අධිතක්සේරු වී තිබුණි. | විශ්‍රාම ප්‍රතිලාභ වගකීමෙහි ධාරණ අගය සහ එහි බදු පදනම අතර ඇතිවන තාවකාලික වෙනස්වීමෙහි ප්‍රතිඵලය බදු වත්කමක් ලෙස සැලකූ විට ගිණුම්වල දක්වා ඇති බදු වගකීම එම ප්‍රමාණයෙන් අඩු වී බදු වත්කම එම ප්‍රමාණයෙන්ම වැඩි වේ. මේ නිසා විගණනය පෙන්වා දී ඇති පරිදි 2019 හා 2020 අවසන් ශුද්ධ බදු වගකීමට කිසිදු බලපෑමක් ඇති නොවේ. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 හි 61A ඡේදයට අනුව වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගන්නා අයිතමයන්ට අදාළ විලම්භිත බදු අගය වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දැක්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ආයුගණක අලාභය රු. 61,720,242 ක් මත විලම්භිත බදු අගය වන රු. 17,281,668 ක් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා නොතිබුණි. | විගණනය පෙන්වා දී ඇති කරුණු හා එකඟ වේ. මෙය ඉදිරි ගිණුම් වලදී නිවැරදි කිරීමට නියමිතය. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ පදනම් කරගෙන සකස්කර තිබුණද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.1 යටතේ දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය නිවැරදිව හෙලිදරව් කළ යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම රු. 282,412,178 ක් වුවද විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛණය අනුව එම වටිනාකම රු. 282,208,329 ක් වූයෙන් රු. 203,849 ක වෙනස මත හඳුනා නොගත් විලම්භීත බදු අගය රු. 57,078 ක් විය. | විගණනය පෙන්වා ඇති කරුණ හා එකඟ වේ. රු.57,348.00 න් අවසන් ශුද්ධ බදු අගය අඩු වී ඇත. | බදු ගණනය කිරීම් නිවැරදිව සිදු කර නිසි පරිදි ගිණුම්ගත කළ යුතුය. |
| (ආ)විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගුවන් කාල ණයගැතියන් සඳහා සමාලෝචිත වර්ෂයේ අඩමාන ණය වෙන්කිරීම රු.4,214,919 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.5,027,070 ක් ලෙස දක්වා තිබීම නිසා රු.812,151 කින් සමාලෝචිත වර්ෂයේ අලාභය වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගණනය කිරීම නිවැරදිව ගිණුම් වල දැක්විය යුතුය. |
| (ඇ)පිළිවෙලින් පිරිවැය රු. 31,078,837ක් හා රු. 1,521,908,873 ක් වටිනා පරිගණක උපාංග සහ සම්ප්‍රේක්ෂණ උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු. 8,789,591 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | 2021 වර්ෂයේ ඔක්තෝබර් මස නිවැරදි කරන ලදි. | ගණනය කිරීම නිවැරදිව ගිණුම් වල දැක්විය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ)දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැහැර හරිනු ලබන බදු අයකිරීමේ ඒකකයේ වාර්තා සහ සංස්ථාවේ බදු ගෙවීම් සම්බන්ධ බදු ගිණුම් අනුව 2020 දෙසැම්බර් 31 දිනට මුළු බදු වගකීම රු. 204,824,632 ක් (දඩ මුදල් රහිතව) විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වගකීම් යටතේ එය රු. 112,099,096 ක් ලෙස දක්වා තිබුණු අතර ඒ අනුව ගෙවිය යුතු හිඟ බදු වටිනාකම රු. 92,725,535 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි වටිනාකම් දැක්විය යුතුය. |
| (ඉ)විකාශනාගාරයන් පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබාගෙන තිබුණු රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙක්ටයාර 0.3194 ක් සඳහා 1995 සිට 2017 වර්ෂයට අදාල බදු කුලිය හා කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හෙක්ටයාර 119.5309 ක් සඳහා 2017 වර්ෂයට අදාල එකතුව රු. 127,149,208 ක් බදු කුලී සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඉඩම සඳහා බදු කුලී ඉවත් කිරීම සඳහා මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරමින් පවතී. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ලැබිය යුතු තැන්පතු | 9,762,842 | 9,343,162 | 419,680 | විගණන නිරීක්ෂණය නිවැරදිය. ඉතා පැරණි මෙම ශේෂ සනාථ කර ගැනීම සඳහා අදාළ නීතිමය කටයුතු වර්තමානය වන විට සිදු කරමින් පවතී. නීතිමය කටයුතු වර්තමානය වන විට සිදු කරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂයන් අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |

### 1.5.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නැවත අයකර ගැනීමේ පදනම මත සංස්ථා සේවකයන්ට සහන මිලට බඩු ලබා දීම සඳහා වැයකළ රු. 248,514 ක් සමාලෝචිත වර්ෂයේ දී ආපසු අයකර ගෙන නොතිබුණි. | කොරෝනා වසංගතය ආරම්භ වීමත් සමඟම රට මුළු මනින්ම වසා දැමීම හේතුවෙන් සංස්ථා සේවයේ යෙදී සිටි සේවක සේවිකාවන් හට අත්‍යවශ්‍ය භාණ්ඩ මුදල් ගෙවා මිලදී ගැනීමට පහසුකම් සලසා දීමට හිටපු සභාපති අනුමැතිය ලබා දී ඇත. එම ලබාගත් මුදල් නිසි පරිදි ගෙවා සියලු බිල් පියවා ඇත. | ගෙවීම් සඳහා නිසි අධිකාරිය ලබා ගත යුතුය. |

### 1.5.7 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ) ඉඩම් . | 7,574,763 | හිමිකම් ඔප්පු, වටිනාකම සනාථ කෙරෙන ලියවිලි ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සත්‍යාපන වාර්තා | විගණන නිරීක්ෂණය නිවැරදිය | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ගොඩනැගිලි | 430,110,257 | ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම් සනාථ කෙරෙන ලියවිලි හා භෞතික සත්‍යාපන වාර්තා | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ)වෙළඳ ණයගැතියෝ | 282,086,956 | ශේෂ සනාථ කිරීම්, ලිපිගොනු විස්තර හා විස්තරාත්මක උපලේඛන විගණන | විගණන නිරීක්ෂණය නිවැරදිය. | අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) වියදම් | 650,388 | අනුමත ගෙවීම් වවුචර් | 2021.12.14 දින විගණන අංශයට යවා ඇත. | වියදම් තහවුරු කිරීම සඳහා අනුමත ගෙවීම් වවුචර ඉදිරිපත් කළයුතුය. |
| (ඉ)<br>(i) ලංකා බැංකුවේ ජංගම ගිණුම් 4 ක ශේෂය | 1,802,445 | ශේෂ තහවුරු කිරීම්, බැංකු ප්‍රකාශන, මුදල් පොත් | සියලුම ශේෂ තහවුරු කිරීමේ ලිපි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ විගණන අධිකාරී වෙත යවන ලෙස ඉල්ලුම් කර 2021.01.05 වන දින සියලු බැංකු ශාඛා වෙත ඉදිරිපත් කර ඇත. | ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |
| (ii) ලංකා බැංකු අයිරාව | (52,000) | කඳුරට සේවය මඟින් පවත්වගෙන යන විස්තරාත්මක මුදල් පොත | 2021.08.09 දින විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. | ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |
| (ඊ) ආයෝජනය | 1,000,000 | කොටස් සහතික | කොටස් සහතික සඳහා සංස්ථාව සතු ලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත. | ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |
| (උ) විවිධ තොග | 21,632,280 | එක් එක් තොග අයිතම් හා වටිනාකම් දැක්වෙන විස්තරාත්මක උපලේඛන | පිළිතුරු සපයා නැත | තෝගයේ පැවැත්ම හා නිරවද්‍යාභාවය තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මුල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.20,508,760 ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ වසර 2 ත් 20 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.6,774,855 ක ශේෂයක් පැවති අතර බාහිර ආයතනවලට නිදහස් කර තිබූ සංස්ථා සේවකයින්ට ගෙවන ලද ප්‍රතිපූර්ණය නොකරන ලද රු. 2,117,912 ක්ද මෙම ශේෂයතුළ ඇතුළත් වී තිබුණි. | විගණන විමසුම් සමඟ එකඟ වේ. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වර්ෂ 2 ත් 8 ත් අතර කාලයට අදාළ රු. 10,635,965 ක් වටිනා ලැබිය යුතු ආදායම් ශේෂ 7 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු 1981 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ එකතුව රු.149,420,035 ක් වර්ෂ 39 ක කාලයක සිට නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | දිගු කලක් පවතින උපචිත වියදම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ)විකාශනාගාර පවත්වාගෙන යන හුන්නස්ගිරිය හා ත්‍රිකුණාමල භූමිය වෙනුවෙන් 2018, 2019 හා 2020 වර්ෂ සඳහා ගිණුම්ගත කර තිබුණු ගෙවිය යුතු බදු කුලී ලෙස රු. 31,905,000 ක් පියවීමට 2021 නොවැම්බර් මස වන විටද ක්‍රියාකර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ගෙවිය යුතු වියදම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1 වගන්තියෙන් සංශෝධිත මු.රෙ. 371 (2) (ආ) සහ 371 (5) අනුව අදාළ කාර්යය නිම කර දින 10 ක් තුළ ලබාගත් අග්‍රිමය පියවිය යුතු වුවද එකතුව රු. 1,016,027 ක් වූ අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පියවීමට කටයුතු කර නොතිබුණි. | වසර 15 ක් ඉක්මවූ අත්තිකාරම් මුදල 2021 දෙසැම්බර් මස නිවැරදිව කටයුතු කර ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2014 සැප්තැම්බර් 17 දිනැති ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක : එස්.එල්.බී.සී/3142 හි 04 වන වගන්තිය අනුව නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් පියවීමට පෙර නැවත අත්තිකාරම් නොදිය යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 24 දෙනෙකුට රු.6,289,418 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | වර්තමානය වන විට මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | රජයේ මුදල් අවභාවිතා නොවන පරිදි කටයුතු කළයුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ) 2015 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015(i) | නිල වාහනයක් හිමි නිලධාරියෙකුට එම නිල වාහනය හෝ රු. 50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ගත හැකි වුවද 2020 ජනවාරි 30 දින සිට මෝටර් රථයක් හිටපු සභාපතිවරයා සඳහා වෙන්කර තිබියදී, මාසික ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලෙස රු. 659,610 ක් ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ II කොටසෙහි 6.2 වැනි වගන්තිය | පැවරුම් පදනම මත සේවය ලබා ගැනීමේදී අදාළ කාර්යය ඉටු කළ පසු රේඛීය අමාත්‍යංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත ගෙවීම් සිදු කළ යුතු වුවද පැවරුම් නිම කිරීමට පෙර අනුමැතියකින් තොරව පැවරුම්ලාභීන් 7 ක් සඳහා 2020 වර්ෂයේ දී රු. 3,519,117 ක් ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2015 හි 3.2.1 ඡේදය හා 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2020 හි 1.2 ඡේදය | මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ සහිතව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය හා භාණ්ඩාගාර ලේකම් දැනුවත් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී හිටපු සභාපතිවරයාට ලීටර 1011 ක අමතර ඉන්ධන අනුමැතියකින් තොරව ලබා දී තිබුණි. | 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2020 හි 3.1 අනුව සභාපතිවරයාට හිමි මාසික ඉන්ධන දීමනා ලීටර 170 ක් වේ. එබැවින් මෙම විගණන නිරීක්ෂණ සමඟ එකඟ නොවේ. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය (බදු පෙර) රු. 14,126,752 ක අලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු. 25,505,571 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 11,378,819 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 75,000,000 කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 17.39 කින් එනම්, රු.114,766,208 කින් අඩු වී තිබුණි. එම විකුණුම් ආදායම අඩු වීම නිසා 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ අලාභය සියයට 16.29 කින් එනම් රු.63,621,181 කින් වැඩි වී තිබුණි. සංස්ථාව 1996 වර්ෂයේ සිට දිගින් දිගටම අලාභ උපයන තත්ත්වයක පසු වූ අතර, මෙම අලාභ සමනය කර ගැනීම සඳහා රාජ්‍ය ප්‍රදාන ලැබී තිබුණි. එසේ වුවද ඇතැම් වර්ෂ වලදී රාජ්‍ය ප්‍රදාන ලැබී තිබියදීත් අලාභ තත්වයන් වාර්තා කර තිබුණි. 2019 ට සාපේක්ෂව 2020 වර්ෂයේ රජයේ ප්‍රදාන සියයට 20.55 කින් එනම් රු.75,000,000 ක් වැඩියෙන් ලබා දීමට රජයට සිදු වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලොචිත වර්ෂයේ අනෙකුත් මෙහෙයුම් වියදම් සහ පරිපාලන වියදම් පිළිවෙලින් සියයට 3.33 කින් එනම් රු. 11,970,192 කින් සහ සියයට 8.08 කින් එනම් රු. 31,708,704 කින් ඉහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතයේ සහ ක්ෂණික අනුපාතයේ පිරිහීමක් පෙන්නුම් කෙරෙන අතර, ඒ අනුව කෙටි කාලීන මූල්‍ය ශක්තියෙහි පිරිහීමක් පිළිබිඹු වේ. තවද ජංගම වත්කම්හි ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 02 සිට වර්ෂ 45 දක්වා පැරණි දේශීය ණයගැති ශේෂ රු.50,491,280 ක් හා විදේශීය ණයගැති ශේෂ රු.62,971,953 ක් ඇතුළත් වීමෙන් ණය අයකර ගැනීමේ හැකියාවක් හා ද්‍රවශීලතාවයක් නොපවතින බව නිරීක්ෂණය විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 2.31 සිට සියයට 1.37 දක්වා අඩුවී තිබූ අතර කොරෝනා වසංගතය හේතුවෙන් විකුණුම් ආදායම රු.114,766,208 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී මෙහෙයුම් ලාභ අනුපාතය සියයට 58.56 සිට සියයට 82.21 දක්වා විශාල ලෙස අඩුවී තිබූ අතර ආදායම් පහත වැටීමත් පරිපාලන වියදම්, වෙනත් මෙහෙයුම් වියදම් හා බෙදාහැරීමේ වියදම් ඉහළ යාම මීට හේතුවී තිබුණි. මෙලෙස අලාභ ලැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් හා අනෙකුත් වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් රු.440,000,000 ක ප්‍රතිපාදන ලබාගැනීමටද සිදුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු වියදම් රු. 4,045,399 ක් නියමිත දිනයට නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවට රු. 30,902 ක දඩ මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | වියදම් නියමිත දිනට ගෙවීමට කටයුතු කළයුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙහි කොටස් මිලදී ගැනීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව 1993 වර්ෂයේදී රු.1,000,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් 2020 වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ආයෝජන සම්බන්ධයෙන් සොයා බලා ප්‍රතිලාභ ලබාගැනීමට ක්‍රියාකළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉක්මනින් අලුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන සම්ප්‍රේෂණ කුලුන සහ ක්ෂුද්‍ර තරංග කුලුන රු. 4,605,256කට අලුත්වැඩියා කිරීම | නව මිල සඳහා මුදල් ප්‍රතිපාදන නොමැතිවීම නිසා අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නතරවිය. | ආයතනය සතු වත්කම්වල ආරක්ෂාව සඳහා කටයුතු කළයුතුය. |

| | | |
|---|---|---|
| සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය 2019 නොවැම්බර් 06 දින ලැබී තිබූ නමුත් 2021 පෙබරවාරි වන විට ද අදාළ කාර්යය ආරම්භකර නොතිබුණි. | | |
| (ආ)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස්කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රසම්පාදන කටයුතු 18ක් සැලසුම් කර තිබුණ ද, ඉන් එක් ප්‍රසම්පාදන කටයුත්තක් හෝ සමාලෝචිත වර්ෂය තුළදී සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. | 2020 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කිහිප අවස්ථාවකදී අඩු කරන ලදී. ඒ අනුව ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරකම් සැලසුම් කර ඉදිරියට කර ගෙන යන ලදී.<br><br>2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඉදිරිපත් කරන ලද පහත සඳහන් කාර්යයන් අවසන් කරන ලදී.<br><br>යාපනය සේවය සඳහා ට්‍රාන්ස්මීටර් 02 ක් මිලදි ගැනීම, ප්‍රධාන කාර්යාලයේ සහ අනෙකුත් විකාශනාගාර සඳහා අවශ්‍ය අමතර කොටස් /උපාංග මිලදී ගැනීම, පුත්තලම විකාශනාගාරය සහ කරබෙවත්ත ඉඩම අතර වැටක් ඉදිකිරීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්යමණ්ඩලයට අනුව තනතුරු 35 ක පුරප්පාඩු 371 ක් හා තනතුරු 42 ක 364 ක අතිරික්තයක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 102 ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණ අතර අනුමත කරන ලද තනතුරු ප්‍රමාණය ඉක්මවා අවස්ථා 6 කදී බඳවාගෙන තිබුණ අතිරික්ත සේවක සංඛ්‍යාව 35ක් විය. | විගණන විමසුම් සමඟ එකඟ වේ. | අනුමත තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදුකළ යුතුය. |

**3.5 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 සැප්තැම්බර් 09 දින අපහරණය කිරීම සඳහා නිර්දේශ කරන ලද සංස්ථාව සතු වාහන 6 ක් අපහරණය කිරීමට කටයුතු කිරීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි. | වාහන දෙකක් ඇස්තමේන්තු කැදවා ආර්ථික වශයෙන් ඵලදායී නම් අලුත්වඩියා කිරීමට නිර්දේශකර ඇත. | අපහරණයට නිර්දේශ කරන ලද වාහන අපහරණය කිරීම සඳහා අප්‍රමාදව කටයුතු කළයුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සහ 2019 වර්ෂයන් සඳහා වන වාර්ෂික වාර්තාවන් 2021 නොවැම්බර් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබූ අතර 2020 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2021 දෙසැම්බර් 31 දින වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | වාර්ෂික වාර්තා අප්‍රමාදව සභාගත කිරීමට කටයුතු කළයුතුය. |